බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ අංක : 28 /2012

මගේ අංකය කේ 05/විවිධ/2012,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09
2012.11.01 වන දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන් හා
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

<u>එළිමහන් සිරකඳවුරු වලට හා වැඩ කඳවුරු වලට සිරකරුවන් මාරු කිරීම</u>

අංක 35/95 හා 1995.09.11 දිනැති චක්‍ර ලේඛය, අංක 09/96 හා 1996.02.10 දිනැති චක්‍ර ලේඛය හා 06/02 හා 2002.01.21 වන දිනැති චක්‍රලේඛ එසේම ක්‍රියාත්මක වන අතර ඊට අමතරව නිදහස් වීමට තවත් අවුරුදු 04 (හතරක) දන්ඩන කාලයක් ඇති සිරකරුවන් එළිමහන් සිරකඳවුරු වලට හා වැඩකඳවුරු වෙත මාරුකර යැවීමට සහ එම කඳවුරු වල රඳවා තබා ගැනීම සඳහා මෙයින් අනුමැතිය ලබා දෙන අතර , පහත සඳහන් කොන්දේසි අනුගමනය කර සිරකරුවන් මාරු කල යුතුය .

01. සිරකරුවන් තෝරා ගැනීම සුභසාධක නිළධාරී විසින් සිදුකළ යුතුය.
02. සුභසාධක නිළධාරී විසින් තොරාගත් සිරකරුවන් අධිකාරීගේ අනුමැතියෙන් පසු මාරු කිරීම් කල යුතුය .
03. තෝරා ගන්නා ලද සිරකරුවන් පළමු, දෙවන හා තෙවන වර බන්ධනාගාර ගතවූ වයස 22 ට වැඩි විසඳීමට නඩු නොමැති පොලිස් පරීක්ෂණ නොමැති සිරකරුවන් විය යුතුය.
04. කඳවුරු සේවයට මාරු කිරීමට පෙර සිරකරුවන් මනා සෞඛ්‍ය තත්වයෙන් සිටින බවට වෛද්‍ය වරයා වෙත ඉදිරිපත්කර වාර්තාවක් ලබා ගතයුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්